# අල්ලස දූෂණය නාස්තියට එරෙහි පුරවැසි බලය
# Citizen Power Against Bribery Corruption Waste

No. 67, "Nandana", Eluwila, Panadura
Tel No : 077 - 4741470

නො. 67, "නන්දන" එළුවිල, පානදුර.
දු.ක: 077 - 4741470


සභාපති තුමා/තුමිය,
අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව,
නො:36 මලලසේකර මාවත,
කොළඹ 07.

**විදේශ රැකියා සඳහා යන ශ්‍රමිකයන්ගේ ගුවන් ටිකට්පත්**
**500 කින් කෝටි 4.5 මුදලක් වැඩිපුර අයකර වංචාවක් සිදු කිරීම.**

2024.11.22 අරුණ පුවත්පතේ පලවූ ලිපියකට අනුව ඊශ්‍රායල්, කොරියා වල, විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයින් 500 පමණ පිරිසකින් ගුවන් ටිකට්පත් සඳහා රුපියල් 75000ක් 90000 අතර මුදලක් වැඩිපුර ඉකුත් මාසයක ඇතුලත ලබාගෙන ඇති බවත් එහි මුළු වටිනාකම කෝටි හතර හමාරකට (කෝටි 4.5) ආසන්න මුදලක් බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කෝසල වික්‍රමසිංහ මහතා පවසන බව පුවත්පත සඳහන් කරයි. මෙය අල්ලස් පනතට අනුව දූෂනයක් සේම රටේ ජනතාවට සිදු කල වංචාවකි. එම නිසා මෙම ක්‍රියාවට සම්බන්ද දේශපාලකයින් හා නිලධාරින් හඳුනාගෙන නීතිය ක්‍රියාත්මක කරන ලෙස අප සංවිධානය ඉල්ලා සිටී.

ස්තුතියි.

මෙයට,

..............................................................................

ජාමුනි කමන්ත තුෂාර
සභාපති
අල්ලස දූෂණය නාස්තියට එරෙහිව පුරවැසි බලය

**අල්ලස දූෂණය නාස්තියට එරෙහි පුරවැසි බලය**
**Citizen Power Against Bribery Corruption Waste**
No. 67, "Nandana", Eluwila, Panadura
Tel No : 077 - 4741470
නො. 67, "නන්දන" එළුවිල, පානදුර.
දු.ක: 077 - 4741470

සභාපති තුමා/තුමිය,
අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව,
නොː36 මලලසේකර මාවත,
කොළඹ 07.

## විදේස් ගත ශ්‍රමිකයන්ට තීරුබදු එහිතව විද්‍යුත් වාහන ආනයනයට දුන් බලපත්‍ර 1000ක් අවභාවිතා කර වංචාවක් සිදු කිරීම.

පසුගිය රජය සමයේ විදෙස් ශ්‍රමිකයන් සඳහා තීරු බදු රහිතව විද්‍යුත් වාහන ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී. ඒ සඳහා ඇමරිකන් ඩොලර් 25000 යටත්ව රෝද දෙකේ විද්‍යුත් වාහන ද ඇමරිකන් ඩොලර් 65000 කට යටත්ව රෝද හතරේ විද්‍යුත් වාහනයක් ද ආනයනය කිරීමට අවසර දෙන ලදී. මෙසේ නිකුත් කරන ලද වාහන බලපත්‍ර 1000 අධික වංචාවක් අවභාවිතා වී ඇති බව විශේෂ විගන වාර්ථාවකින් පෙන්වා දී ඇත. තවද මෙසේ එම බලපත්‍ර හිමි විය යුතු විශාල පිරිසකට එම අවස්ථාව අහිමි වී ඇති අතර ලැබිය යුතු නිසි පුද්ගලයන්ට එම අවස්ථාව ලබා නොදී දේශපාලකයින් හා නිලධාරීන් කූට ව්‍යාපාරයකින් මෙම ජාවාරමට සම්බන්ධ වී ඇත. එම නිසා මෙමගින් රජයට සිදු වූ අලාභය රජයට අය කරගන්නා ලෙසත් මෙම වංචාවට සම්බන්ධ පුද්ගලයන් නීතියේ රැහැනට අසු කර දඩුවම් ලබා දෙන ලෙස අප සමිතිය ඉල්ලා සිටි.

ස්තුතියි.

මෙයට,

.........................................................................

ජාමුනි කමන්ත තුෂාර
සභාපති
අල්ලස දූෂණය නාස්තියට එරෙහිව පුරවැසි බලය